## 343 සව් සොම් සිරින්

සව් සොම් සිරින් සුසැදි
ජේසුගෙ හද මන්නා දී
සව් සත වෙත පෙම් බැඳි
පෙම් නොම ලැබ දුක් විඳී

ඔබ හට ජේසුනි දිව් හිමියෙන්
කැපවෙමු අපි මෙදින
ඔබ සිරි හෘදය ලැදි අදරින්
සනසමු අපි නිතින

මා පිය සිරි හදෙනි
පෙම් ගිනිදැල් උදුනෙනි
මා හද තුළ නිතිනි
දල්වනු ඔබ පෙම් ගිනි

මෙන් ඔබ හද බැහැපත්
මෙත් කුළුණු ගුණෙන් දිමුත්
සුහදයන් අප තුළත්
සාදනු දුරැර දුසිත්

මන් පිනවන ජේසුනි
පෙම් වඩවන හදෙනි
එන් අප විමන් මෙතිනි
වෙන් අපරද නිතිනි